# හොමෝ සේපියන් මානවයා පාහියන් ලෙන ආශ්‍රිත ජනාවාස පිහිටුවා ගැනීමට බලපෑ පාරිසරික සාධක පිළිබඳව අධ්‍යයනයක්

**පූජ්‍ය. පාහියංගල සුමංගල හිමි**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sumangala909@yahoo.com

---

ප්‍රාග්ඓතිහාසික පාහියන් ගල්ලෙන තුළ දනට කර ඇති පර්යේෂණ කැණීම් මගින් එහි ජනාවාසය අදින් වසර 48000 ක් දක්වා ඈත අවධියට ගමන් කරයි. එනම් සංස්කෘතික අවධීන් ලෙස සලකන මධ්‍ය ශිලා යුගයටත්, භූ විද්‍යාත්මක කාල රාමුව අනුව අවසන් ප්ලයිස්ටසීන සමයේ සිට හොලෝසීන සමය දක්වාය. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ප්‍රාග්ඓතිහාසික ගුහා ක්ෂේත්‍ර අතරින් තවමත් පර්යේෂණ සිදුකරමින් පවතින පා-හියන් ලෙන ආශ්‍රිත අතීත මානවයා ජනාවාස පිහිටුවා ගත්තේ මන්ද යන ගැටළුව පදනම් කරගත් මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය සහ ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදයන් භාවිත කරනු ලැබිණි.

හොමෝ සේපියන් මානවයා පාහියන් ලෙන ආශ්‍රිත ජනාවාසය පිහිටුවා ගැනීමේදී භූ භෞතික සාධක ප්‍රබල සාධකයක් වී ඇති බව ස්ථානීය පර්යේෂණ ඇසුරෙන් පැහැදිලි විය. එම භූ භෞතික සාධකයන් අතර භූමියේ පිහිටීම, ජලවහන රටාව, පස, දේශගුණය, ශාකායනය හා සත්ත්වායනය, භූ රූපණය, පාෂාණ හා ඛනිජ ආදිය ප්‍රමුඛ වේ.

මෙම අධ්‍යයනයේදී පැහැදිලි වූ මූලික කරුණක් වූයේ ප්‍රාග්ඓතිහාසික මානවයාට ජීවත්වීමට සහ දෛනික අවශ්‍යතාවන් සපුරාලීමට ඉතාම උචිත පරිසරයක් තත් කලාපයේ පිහිටා තිබීම ප්‍රාග් මානවයා මෙම ස්ථානයට ආකර්ෂණයවීමට හේතු වූ බවය. ප්‍රාග් මානවයාගේ ජීවනෝපාය රැඳී පැවතියේ දඩයම හා ඵලවැල එකතුකිරීම මත පදනම්වය. පාහියන්ගල ගුහා ක්ෂේත්‍රය අවට කලාපය මෙකී අවශ්‍යතාවන් සපුරාලීමට සුදුසු පරිසර පද්ධතියකින් යුක්තය. ප්‍රාග් ඓතිහාසික මානවයා මෙම කලාපයේ කේන්ද්‍රගතවීමට බලපාන ලද ප්‍රබල සාධකය ලෙස ප්‍රමාණයෙන් විශාල ගුහා ක්ෂේත්‍රය පෙන්වාදිය හැකිය. මෙම කලාපයට ලැබෙන්නා වූ ධාරානිපාත වර්ෂාව තුළින් බේරී සිය දෛනික කටයුතු සිදුකරගෙන යෑම සඳහා මෙම ගුහා ක්ෂේත්‍රය ප්‍රාග් මානවයාට මනා නිවහනක් සපයන්නට ඇත. එසේම මෙම ගුහා ක්ෂේත්‍රය ප්‍රාග් මානවයාට බියකරු සතුන්ගෙන් වන උපද්‍රවවලින් බේරී සිටීමට ආරක්ෂාවක් සපයන්නට ඇත. මෙම ගුහා ක්ෂේත්‍රය පිහිටි පොළොවේ සිට ඉහළ උන්නතාංශයකින් පිහිටා තිබීම ලෙන තුළට සතුන්ගේ පැමිණීමට බාධාවක්වීම වැදගත් වේ. තව ද මෙම විශාල ගුහා ක්ෂේත්‍රය කිසිම අයුරකින් අභ්‍යන්තරයට ජලය නොපැමිණෙන ලෙස නිර්මාණය වී තිබීම ද වැදගත් වේ. ක්ෂේත්‍රයට පහළින් ගලා යන නිග්ගහ දොල සහ සත්ත්වායනය හා ශාකායනය මානවයාගේ ජල පරිභෝජනය සහ යැපීම් ක්‍රමය පහසු කරන්නට ඇත. ශිලා අයුධ නිර්මාණයේදී තිරුවාණා, කහඳ ආදී ඛනිජය සහ පාෂාණ තත් ප්‍රදේශයෙන් බහුලව සොයාගන්නට ඇත. යථෝක්ත කාරණා හේතු කොටගෙන ප්‍රාග් ඓතිහාසික මානවයා මෙම ස්ථානය සිය වාසස්ථානය සඳහා තෝරාගැනීමේදී පාරිසරික සාධක පදනම් කරගත් බව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : පා-හියන් ලෙන, භූ භෞතික සාධක, ජනාවාස